*Vidvān - Ruhuna Undergraduate Academic Journal of Pali and Buddhist Studies*
*Volume I , Issue I*
*ISSN: 3121-5033*

# ජෛන ඥාන විභාගය පිළිබඳ බෞද්ධ ආකල්පය: බෞද්ධ ඥාන මීමාංසාව ඇසුරෙන් අධ්‍යයනයක්

ඩබ්. එම්. දිලිනි හර්ෂනී වෙලගෙදර
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
diliniharshani215@gmail.com

**සාරසංක්ෂේපය**

දර්ශනය යන්න පුළුල් විෂය ක්ෂේත්‍රයකි. ඥාන විභාගය යනු එහි තවත් එක් උප විෂයකි. ඒ තුළ සත්‍ය කුමක්ද, ඥානය ලැබෙන්නේ කෙසේද, යථාර්ථය කෙසේ අවබෝධ කරගත හැකිද යන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. එහිදී ජෛන දර්ශනය දැක්වූ ප්‍රතිචාර සම්බන්ධයෙන් බෞද්ධ දර්ශනය දරන ආකල්පය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය මගින් සිදු කෙරේ. ඒ අනුව මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ ජෛන ඥාන විභාගය යනු කුමක්ද යන්න හඳුන්වා ඒ පිළිබඳ බෞද්ධ දර්ශනය තුළ දරන ආකල්පය අධ්‍යයනය කිරීමයි. එසේම මෙහි උපන්‍යාසය වන්නේ පුළුල් මෙන්ම ගැඹුරු දර්ශනයක් වන ජෛන දර්ශනය නැතහොත් ජෛන ආගම හා බෞද්ධ දර්ශනය තුළ සමානතා මෙන්ම විෂමතා හඳුනාගත හැකිය යන්නයි. ජෛන ඥාන විභාගය කෙරෙහි බෞද්ධ ඥාන විභාගය තුළ දක්නට ඇති ආකල්පය පිළිබඳ අවබෝධයක් ලබාදීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය යොදා ගනිමින් මෙම පර්යේෂණය සිදුකොට ඇති අතර ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ත්‍රිපිටකයත්, ද්විතීයික මූලාශ්‍රය යටතේ විවිධ කතුවරුන් විසින් රචිත ග්‍රන්ථත් යොදා ගැනිණ. ජෛන ඥාන දර්ශනය භාරතීය දර්ශනයන් අතර සුවිශේෂී ඥාන දර්ශනයක් වන නමුත් ඔවුන්ගේ සත්‍ය පිළිගැනීම, ආත්මවාදය වැනි දෑ මත පදනම් වීම නිසාවෙන් බෞද්ධ ඥාන විභාගය තුළ එය සංසන්දනයට ලක් කළ හැකි බව සනාථ වේ.

***ප්‍රමුඛ පද:*** *ජෛන ඥාන විභාගය, බෞද්ධ ඥාන විභාගය, ඥාන විභාගය, දර්ශනය, බෞද්ධ ආකල්පය*

**Article History**: **Received**: 29.03.2026 **Accepted**: 30.06.2026


*© Editor in Chief: Dr. Ven. Koggalle Wijitha, Editor: Dr. Thusitha Rajapaksha*
*Vidvān, Department of Pali and Buddhist Studies,Faculty of Humanities and Social Sciences, University of Ruhuna, Sri Lanka.*

## 1. හැඳින්වීම

දර්ශනය මිනිසාගේ ජීවිතය, ලෝකය හා සත්‍ය පිළිබඳ ගැඹුරු ලෙස විමර්ශනය කරන බුද්ධිමය විෂය ක්ෂේත්‍රයකි. එනිසාම ලෝකයෙහි දක්නට ලැබෙන පුළුල් විෂයක් ලෙස 'දර්ශනය' යන්න හඳුනාගත හැකිය. ඥාන විභාගය එහි එන එක් සුවිශේෂ විෂයකි. මෙමගින් අර්ථ ගැන්වෙන්නේ 'ඥානය පිළිබඳ දැනීම' යන්නයි. දර්ශනය යන පුළුල් විෂය ක්ෂේත්‍රය තුළින් සත්‍ය කුමක්ද, ඥානය කෙසේ ලැබෙන්නේද සහ යථාර්ථය කෙසේ අවබෝධ කරගත හැකිද යන්න පිළිබඳ මූලික ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. විවිධ දර්ශන පද්ධති මේ ප්‍රශ්න වලට විවිධ ආකාරයෙන් ප්‍රතිචාර දක්වයි. ඒ අතරින් ජෛන ඥාන දර්ශනය සුවිශේෂී වේ. ජෛන ඥාන දර්ශනය භාරතයේ පැවති අනෙක් දර්ශනයන්ට වඩා සුවිශේෂීත්වයක් දරන්නේ එහි වූ ඥාන මාර්ගය පුද්ගලයා හා සමාජයට වැදගත් නිසාවෙනි. මෙලෙස ඔවුන් දැක්වූ ප්‍රතිචාර සම්බන්ධයෙන් බෞද්ධ දර්ශනය දරන ආකල්පය මෙම පර්යේෂණය හරහා අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වේ.

## 2. සාහිත්‍ය විමර්ශනය

ජෛන ඥාන විභාගය පිළිබඳ විවිධ මූලාශ්‍රයන්හි තොරතුරු දක්නට ලැබේ. එමෙන්ම බෞද්ධ ඥාන විභාගය පිළිබඳව ද බොහෝ මූලාශ්‍රයන්හි තොරතුරු වේ. මෙහිදී කේ.එන්. ජයතිලක මහතාගේ මුල් බුදු සමයේ ඥාන විභාගය නම් ග්‍රන්ථයෙහිත්, රාධක්‍රිෂ්ණන්ගේ ඉන්දීය දර්ශනය (1) නම් ග්‍රන්ථයෙහිත් අන්තර්ගත තොරතුරු මේ සඳහා පාදක කරගන්නට විය. ඒ අනුව දයා ඉදිරිසිංහ මහතාගේ අවෛදික දර්ශනය හා ජෛන ඥාන විභාගය යන ග්‍රන්ථයත්, නාරාවිල ධම්මරතන හිමියන්ගේ භාරතීය දර්ශන නම් ග්‍රන්ථයත්, හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමියන්ගේ භාරතීය දර්ශන නම් ග්‍රන්ථයත් එමෙන්ම ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සූත්‍ර පිටකයෙහි එන අංගුත්තර නිකාය, මජ්ඣිම නිකාය, දීඝ නිකාය, සංයුත්ත නිකාය ආදියත් යොදා ගනිමින් ජෛන ඥාන විභාගය හා බෞද්ධ ඥාන විභාගය පිළිබඳ තවදුරටත් විමර්ශනය කිරීමට හැකි විය.

## 3. පර්යේෂණ ගැටලුව

ජෛන ඥාන විභාගය යනු කුමක්ද යන්න හඳුන්වා හා ඒ පිළිබඳ බෞද්ධ දර්ශනය තුළ දරන ආකල්පය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ගැටලුවයි.

## 4. පර්යේෂණ අරමුණු

ඥාන විභාගය හඳුන්වා දීමත්, ජෛන දර්ශනය හා ජෛන ඥාන විභාගය පිළිබඳ අවබෝධයක් ලබා දීමත්, බෞද්ධ ඥාන විභාගය පිළිබඳව අවබෝධයක් ලබා දීමත් සහ ඒ ඔස්සේ ජෛන ඥාන විභාගය කෙරෙහි දක්වන බෞද්ධ ආකල්පය පිළිබඳ අවබෝධයක් ඇති කිරීම මූලික අරමුණයි.

## 5. පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය යොදා ගනිමින් මෙම පර්යේෂණය සිදුකොට ඇති අතර ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ත්‍රිපිටකයත් ද්විතීයික මූලාශ්‍රය යටතේ විවිධ කතුවරුන් විසින් රචිත ග්‍රන්ථත් යොදා ගැනිණ.

## 6. සාකච්ඡාව

### 6.1 ඥාන විභාගය හැඳින්වීම

ඥාන විභාගය "Epistemology" වශයෙන් හඳුන්වන අතර එය "Episteme" නම් ග්‍රීක පදයෙන් බිහිවූවකි. එයින් ඥානය යන අර්ථය ලබාදේ. ඉංග්‍රීසි භාෂාවෙන් "Theory of Knowledge" ලෙස හඳුන්වයි. මෙමඟින් ඥානය පිළිබඳ දැනීම, ඥාන මීමාංසාව යන අරුත් ලබා ලබා දේ. සරලවම කියතොත් ඥාන විභාගය යනු, දෙයක් පවතින ආකාරය පිළිබඳ දැන ගැනීමයි. තවත් අර්ථකථනයක් දක්වන්නේ නම් විෂය දැනුම නොව දැනුම සිදුවන ආකාරය පිළිබඳ දැනීමයි. ඥාන විභාගය නම් වූ විෂය ක්ෂේත්‍රය දුරාතීතයේ පටන් පෙරදිග හා බටහිර බිහි වූ දාර්ශනිකයන් අතර සාකච්ඡාවට ලක් කෙරුණු සුවිශේෂී තේමාවකි. ඒ නිසාම දාර්ශනිකයන් අතර ඥාන විභාගයට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. ලෝකය බිහි වූ දා පටන් ආරම්භ වූ මානව ශිෂ්ටාචාරය ශිෂ්ටවත් සමාජයක් වීම ආරම්භවීමේ පටන්ම මිනිසා ඥානය යන්නෙන් අදහස් කරනු ලබන්නේ කුමක්ද, එය ලබාගත හැක්කේ කෙසේද, නිවැරදි වූ ඥානයක් ලබා ගැනීම සඳහා භාවිතා කළ හැකි මාර්ග කවරේද, දැනීම සහ විශ්වාසය යනු කුමක්ද, සත්‍ය කුමක්ද, යනාදී වශයෙන් මතු වූ ගැටලු වලට අදාලව කරුණු වටහාගැනීමට උත්සාහ දැරූහ.

මෙම ඥානය සම්බන්ධ වූ විෂය ක්ෂේත්‍රය පෙරදිග ඉන්දියානු දර්ශනවල විවිධ නම්වලින් හඳුන්වා ඇත. ඒ අතර "ඥාන විභාගය", "ඥාන මීමාංසාව", "ඥානය" යනාදී වචන දක්නට ලැබේ. පෙරදිග දර්ශනය තුළින් ඥානය පිළිබඳ සාධකමය ක්‍රම මත පදනම් වූ විග්‍රහයක් ලබා දේ. පෙරදිග දාර්ශනික සමය තුළ "තක්කී වීමංසී" නම් දාර්ශනික ගුරුකුල සිටි බවද මහාචාර්ය දයා එදිරිසිංහයන් (2017) විසින් රචිත 'අවෛදික දර්ශන හා ජෛන ඥාන විභාගය' නම් ග්‍රන්ථයේ සඳහන් වේ. කේ. එන්. ජයතිලකයන් (2003) විසින් අධ්‍යයනය කෙරුණු සූත්‍රයක් වන "සංගාරව සූත්‍රය" තුළද මෙම 'තක්කී වීමංසී' නම් ගුරු කුලය පිළිබඳ දැක්වේ. සංගාරව මානවකයා විසින් බුදුරජාණන් වහන්සේගෙන් මෙලෙස විමසුමක් කෙරේ. "ගෞතමයන් වහන්ස මෙලොවදී ම පාරමී සංඛ්‍යාත නිවනට පැමිණ ආදි බ්‍රහ්මචරියාව ප්‍රකාශ කරන ශ්‍රමණ බ්‍රාහ්මණයන් අතරින් ඔබ වහන්සේ කවරෙක්ද? (1973ඃ (322). මෙයට පිළිතුරු ලබාදීමේ දී, අනුස්සවිකා, තක්කී වීමංසී හා සාමඤ්ඤේව ධම්මං අභිඤ්ඤාත වශයෙන් පුද්ගලයන් තිදෙනෙක් පිළිබඳ පැහැදිලි කිරීමක් සිදුකර ඇත. මෙසේද ඉහත දැක්වූ පරිදි තක්කී වීමංසී නම් ගුරුකුලයක් සිටි බව සනාථ වේ.

කේ.එන්. ජයතිලක මහතා මෙමගින් ප්‍රධාන සම්ප්‍රදායන් තුනක් හඳුන්වා දෙන අතර, තක්කී වීමංසී නම් පුද්ගලයන් 'බුද්ධිවාදය' නම් සම්ප්‍රදායට අයත් බවද පෙන්වා දේ. මෙලෙස නූතන ලෝකය තුළ දැනුමට විශේෂ තැනක් හිමි වේ. ඥානයේ ඉලක්ක වන්නේ දැනීමේ සීමාවන් හා විභවතාවන් පුළුල් කිරීමයි. මෙම ඥාන විභාගය තවත් ආකාරයකින් අනු අංශ තුනකට බෙදා දැක්වීමක් හඳුනාගත හැකිය. ඒ ඥානයේ ස්වභාවය, ඥානයෙහි ප්‍රභවය හා ඥානයෙහි සීමා යනුවෙනි. මෙම ප්‍රස්තුත සම්බන්ධයෙන් ගැඹුරින් අධ්‍යයනය කිරීමේ දී ඥානය යනු කුමක්ද?, ඥානය අප ග්‍රහණය කර ගන්නේ කෙසේද?, අප තුළ ඇති විශ්වාස සාධාරණීයකරණය කර කරගන්නේ කෙසේද?, අප කිසිවක් නිශ්චිතව දැනගන්නේ කෙසේද? යන ප්‍රශ්නවලට පිළිතුරු ලබාදීමට උත්සාහ ගැනේ. ඥාන විභාගයේ කාර්යභාරය දැක්වීමේදී එය සුවිශේෂී පැති කිහිපයක් ඔස්සේ  මොවුන් විසින් පෙන්වා දී තිබේ.  ඒ දැනුම නිර්වචනය කිරීම, සාධාරණීයකරණය සහ විශ්වාසය, සැක කිරීම, සෙසු විෂයන් කෙරෙහි බලපෑම් කිරීම ආදී වශයෙනි.  එමෙන්ම ඥාන විභාගයේ අරමුණු හා පරමාර්ථ ද මොවුන් විසින් පෙන්වා දී තිබෙන ආකාරය හඳුනාගත හැකිය. ඒ අනුව එහි අරමුණු  දැනුම අර්ථ දැක්වීම දැනුමේ මූලාශ්‍රය තේරුම් ගැනීම සාධාරණීයකරණයෙන් පරික්ෂා කිරීම, දැනුමෙන් සීමාවන් ගවේශනය, සංශයට ප්‍රතිචාර දැක්වීම වශයෙන් පෙන්වා දිය හැකිය. එහි පරමාර්ථ, සත්‍ය විශ්වාසය හා සාධාරණීකරණය වැනි සංකල්ප හඳුනා ගැනීම, දැනුම සඳහා නිර්ණායක සකස් කිරීම, ඥාන විභාග පද්ධතිය ඇගයීම, තාර්කික චින්තනයට මඟ පෙන්වීම සදාචාරාත්මක හා විද්‍යාත්මක චින්තනයට සහාය දීම යනාදී වශයෙන් වේ. මෙලෙස නූතන ලෝකය තුළ ඥාන විභාගය විවිධ ආකාරයේ බෙදීම්වලට ලක් කර ඇති ආකාරයක් හඳුනාගත හැකිය.  ඉන්දියානු දාර්ශනිකයන් අතරින් බොහොමයක් දෙනා ඥානය සපයන්නා වූ මාර්ගය ලෙසට පිළිගනු ලබන්නේ 'වේදය' යි. භාරතීය දර්ශන සම්ප්‍රදායේ සම්ප්‍රදායන් ද්විත්වයක් දක්නට ලැබුණේ ද මේ කාරණය පදනම් වීමෙනි. වේදය තමන්ගේ මූලාශ්‍රය ලෙසත්, එහි කිසිදු කාරණයක් වෙනසට භාජනය නොකර පවත්වාගත යුතු දෙයක් බවත්, එය දෙවියන්ගේ කැමැත්ත පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්නක් බවටත්, ඥානය සපයන මාර්ගය බවටත් පිළිගත් පිරිසක් විය. ඔවුන් බ්‍රාහ්මණ නැතහොත් වෛදික සම්ප්‍රදාය වේ. මෙම වේදය ප්‍රතික්ෂේප කළ පිරිසක් ද විය. ඔවුන් වෛදික නැතහොත් ශ්‍රමණ සම්ප්‍රදාය වේ. මොවුන් ඥානය ලබා ගැනීමේ මාර්ග ලෙස සැලකුවේ සම්ප්‍රදාය, තර්කය, චින්තනය, ප්‍රත්‍යක්‍ෂය, ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය යනාදීයයි. ඒ අතරට ජෛන, ජටිල, ආජීවක, පරිබ්‍රාජක හා තාපස යන පිරිස් ඇතුළත් විය. ඥානය නොදැනීම පිළිබඳ උපනිෂද් ග්‍රන්ථයන්වලද තොරතුරු ඇතුළත් වේ.

ඥාන විභාගය පිළිබඳ විවිධ අර්ථකථනයන් හඳුනාගත හැකිය. දර්ශනය පිළිබඳ විශ්වකෝෂයෙහි මෙය අර්ථ ගැන්වෙන්නේ මෙසේය. "ඥාන විභාගය හෙවත් ඥානවාදය යනු ඥානයේ ස්වභාවය සහ විෂය ක්ෂේත්‍රය පිළිබඳව අධ්‍යයනය කරනු ලබන දර්ශන ක්ෂේත්‍රයට අයත් ශාඛාවකි." (එදිරිසිංහ, 1946: 8)

"ඥාන විභාගය පිළිබඳ හඳුන්වා දීම ආරම්භයේදීම දැක්වූ ආකාරයට Episteme යන පදයෙන් බිහි වූ Epistemology නැතහොත් ඥාන විභාගයෙන් ඥානය පිළිබඳ අධ්‍යයනය කරන බවය" (එදිරිසිංහ, 1946:8). එතුමා විසින්ම තවදුරටත් දක්වා සිටින්නේ ඥානය හා විශ්වාසය අතර සෘජු සම්බන්ධතාවයක් පවතින බවයි. තවද එදිරිසිංහයන් සඳහන් කරන්නේ මහාචාර්ය පී. ඩී. ප්‍රේමසිරි විසින් බෞද්ධ විශ්වකෝෂයට රචිත ලිපියක "ඥාන විභාගය මගින් ඥානයේ ස්වභාවය හා විෂය පථය විමසන බව" දක්වා ඇති බවයි. (1946: 8). මෙම පර්යේෂණය සඳහා වැදගත් කාරණයක් මෙම නිර්වචන පිළිබඳ අධ්‍යයනයේදී හඳුනාගන්නට ලැබිණ. එනම් ක්‍රිෂ්ණචන්ද්‍ර බට්ටාචාර්ය ප්‍රකාශ කර සිටින්නේ "ජෛනයන් හට උසස් ඥාණ විභාගයක් පැවති බවයි." (එදිරිසිංහ,1946: 9). එලෙස දැක්වීමට මුල් වූ කාරණය නම් ජෛන දර්ශනය බුදුරජාණන් වහන්සේ බිහිවීමට පෙර ආරම්භ වූවක් වීමයි. වර්තමාන මහාවීරතුමන් බුදුරදුන්ට සමකාලීනව සිටි ජෛන දහමට අයත් විසිතුන්වන තීර්තංකර ලෙස දක්වන කාරණයෙන් ද ඔවුන්ට ඉතා දීර්ඝ ඉතිහාසයක් පවතින බව පැහැදිලි වේ.

### 6.2 ජෛන දර්ශනය

ජෛන දර්ශනය ඉන්දියාවේ බිහි වූ අවෛදික දර්ශන අතර පැරණිතම දර්ශනයකි. මෙම දාර්ශනයෙහි බුදුරජාණන් වහන්සේට සමකාලීනව සිටි තැනැත්තා නිගණ්ඨනාථපුත්ත වේ. ඔහු වර්ධමාන මහාවීර ලෙසද හඳුන්වයි. ඔහු මොවුන්ගේ දර්ශනයට අයත් විසි තුන්වන තීරතංකරවරයා වේ. ජෛන දර්ශනය භාරතීය ශ්‍රමණ සම්ප්‍රදාය නැතහොත් අවෛදික සම්ප්‍රදාය නියෝජනය කළ ප්‍රධානතම ගුරුකුලයකි. එමෙන්ම මෙය වර්තමානය වන විටත් භාරතයේ පවතින ජීවමාන දර්ශනයකි. එනිසාම මේ වන විටත් බොහෝ පිරිසක් ජෛනාගම අදහනු ලැබේ. ඉන්දියානු ප්‍රභවයක් ඇති ජෛනාගම හා දර්ශනය ඉන්දියාවේ දේශීය ඇගයුම් පද්ධතිය හා සමානතාවයක් දක්වයි. එමෙන්ම මොවුන් සංසාරගතවීමෙන් මිදීම සඳහා අනුගමනය කළ යුතු මෝක්ෂ මාර්ගයක් ඉදිරිපත් කරනු ලැබීය. එසේම කර්මය හා පුනර්භවයද ඔවුන්ගේ ඉගැන්වීම් වල කේන්ද්‍රීයය සංකල්පයකි. මොවුන් බුදු දහමට පෙර බිහි වූ දාර්ශනිකයන් පිරිසක් වන අතර මෙම කාරණය කෝල්බෲක් ප්‍රින්සස් ස්ටීවන්සන් විසින් හෙළිදරව් කර ඇත. ඇතැම් ඉන්දියානු දාර්ශනිකයන් ජෛන දර්ශනය උසස් දාර්ශනික අදහස් ඉදිරිපත් කරන්නක් ලෙසට නොපිළිගනිති. එනිසාම සාම්ප්‍රදායික වෛදික දර්ශනය පිළිගත් ඉන්දියාවේ උගතුන් ජෛන දර්ශනය පහත් දර්ශනයක් ලෙසට සලකා ඇත. නමුත් මෑතකදී කෙරුණු පර්යේෂණ බොහොමයක ප්‍රතිඵලයක් ලෙස ජෛන දර්ශනය සාම්ප්‍රදායික වෛදික පිරිස් දැක්වූ පරිදි දුෂ්කර නොදියුණු හා අශීලාචාර දර්ශනයක් යන කාරණය ප්‍රතික්ෂේප කොට ඇත.

ඒ අනුව පර්යේෂණයේ නියැලුණු ඒ.එල්. බෂාම් නත්මාල් තතියා, බී.එම්.බරුවා, කේ.එන්. ජයතිලක ආදී පර්යේෂකයන් මෙම දර්ශනය උසස් ඥාන විභාගීය ඉගැන්වීම්වලින් යුක්ත වූවක් බව හෙළිකොට ඇත. මේ නිසා ඉන්දියාවේ බිහි වූ ජෛන දර්ශනයේ ඥාන විභාගය පිලිබඳ අධ්‍යයනය ඉතා වැදගත් වේ.

## 6.3 ජෛන ඥාන විභාගය පිළිබඳ බෞද්ධ ආකල්පය

බුද්ධකාලීන ජෛන දාර්ශනිකයන්ට පැවතියේ උසස් ඥාන විභාගයකි. එලෙස සඳහන් කළ හැක්කේ ක්‍රිෂ්ණචන්ද්‍ර බට්ටාචාර්‍ය වැන්නවුන් ජෛන ඥාන විභාගය උසස් වූවක් ලෙස ප්‍රකාශ කර සිටීම වැනි සාධක මත පදනම්වය. තවදුරටත් පැවසුවහොත් බෞද්ධ දර්ශනය ආරම්භයට පෙර පැවති දර්ශනයන් අතර බොහොමයක් දෙනා පිළිගත් දර්ශනයක් බවට පත්ව තිබිණ. ජෛන ඥාන විභාගය තර්ක ශාස්ත්‍රය, පාරභෞතික විද්‍යාව හා ආචාර ධර්ම එකිනෙකට සම්මිශ්‍රණය වී පවතින්නකි. බෞද්ධ දර්ශනය ඉන්දියානු දර්ශන වාදය තුළ බිහිවූ සුවිශේෂී මෙන්ම අවෛදික දර්ශන අතර පවා ප්‍රමුඛස්ථාන හිමිකරගත් දර්ශනයකි. මේ අනුව පෙන්වා දිය හැක්කේ අවෛදික දර්ශනයන් අතර ගැඹුරු දර්ශනයක් ජෛන හා බෞද්ධ යන දර්ශනයන් ද්විත්වය යටතේ හඳුනාගත හැකි බවයි.

බුද්ධකාලීන ජෛන දර්ශනය පුරෝගාමියා වූයේ ජෛන මහාවීරතුමන්ය. ඔහු ඉදිරිපත් කළ සංකල්ප අතරින් පරම අවිහිංසාවාදයක් හඳුනාගත හැකිය. ඒ අනුව ඔවුන්ගේ දර්ශනයේ දක්නට ලැබෙන්නේ පරම අවිහිංසාවාදයකි. මෙය චතුයාම සංවරය ලෙසද හඳුන්වයි. මෙම චතුයාම සංවර සීලය කොටස් හතරක් යටතේ සාමඤ්ඤඵල සූත්‍රයේ දක්වා ඇත.

- සබ්බවාරී වාරිතෝ ච හෝති - සියලු සිසිල් දියෙන් වැළකීම
- සබ්බවාරී යුතෝ - සියලු සංවරයෙන් යුක්තවීම
- සබ්බවාරී ධුතෝ - සියලු පව් බැහැර කිරීම
- සබ්බවාරී ඵුඨෝ - සියලු පව් බැහැර කොට නිවාරණය හේතුකොට ගෙන මෝක්ෂයේ ස්පර්ශ
  කිරීම

එසේම, මිනිසුන් තමාගේ සංවරකම හැකිතාක් දුරට ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම අවධාරණය කරන මොවුන් එසේ සංවර කර ගැනීම සඳහා අවශ්‍ය ගුණාංග තුනක් පෙන්වා දේ. එනම්,

- කාය දණ්ඩ
- වචී දණ්ඩ
- මනෝ දණ්ඩ යනුවෙනි.

මෙලෙස මොවුන් දැක්වූ චතුයාම සංවරයට අනුව පුද්ගලයා විසින් සිසිල් පැන් නැතහොත් ඇල් දිය පානයේදීත්, ආශ්වාස ප්‍රශ්වාස කිරීමේදීත්, ජලය සහිත ස්ථානවලින් ගමන් කිරීමේදීත්, ජීවීන් මරණයට පත් වේ යැයි සිතා ඒවායින් වැළකී සිටිය යුතු බව පෙන්වා දේ. ඒ සඳහා මුඛවාඩම් බැඳීමද අනුමත කර තිබේ. ගස් වැල් සිඳීම පවා පාපයක් ලෙස සලකයි. මහමග යන එන විට මාර්ගය අතුගාමින් යා යුතු බවද මොවුන් පෙන්වා දුනි. මොවුන්ගේ ඉගැන්වීමක් වන පංච විරමණය යටතේ එන ප්‍රාණඝාත විරමණය වන පළමු විරමණය යටතේ පෙන්වා දෙන්නේ ද මේ කාරණයමය. මෙම පරම අවිහිංසාවාදී ජෛන මතය ව්‍යවහාරික ජීවිතයේදී පුද්ගලයාට ප්‍රායෝගික නොවන්නකි. එනිසාම බෞද්ධ දර්ශනය තුළ මෙම පරම අවිහිංසාවාදය බැහැර කෙරේ. පුද්ගලයාට සෑම විටම මෙහි දැක්වෙන පරිදි ඇල්දියෙන් වැළකීමට, මුඛවාඩම් පැළඳීමට, ජලයෙන් එතෙර නොවී සිටීමට නොහැකිය. ඒවා පුද්ගලයාට එදිනෙදා ජීවිතයේදී මුහුණ දීමට සිදුවන අවස්ථාවන් වේ. එනිසා බුදු සමය පෙන්වා දෙන්නේ මෙවැන්නකින් ඉතා වෙනස් දෙයකි. එනම් පුද්ගලයාට නුසුදුසු වන්නේ චේතනාව මුල්වීමෙන් කෙරෙන ප්‍රාණඝාතයන්ය. චේතනාව මුල් වී කෙරෙන දෑ මත පදනම්ව පුද්ගලයාට කර්ම විපාක ලැබේ. එලෙස නොවුණු සෑම අවස්ථාවකම නොදැනීමෙන් සිදුවන ක්‍රියාවලට වගකීමක් පුද්ගලයාට ගත නොහැකිය. අංගුත්තර නිකායට අයත් නිබ්බේධික සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා දේශනා කරන කරනු ලැබුවේ, චේතනාව කර්මය වන බවත් එය කායික වාචසික හෝ මානසික වශයෙන් සිදුවිය හැකි බවත්ය. "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි චේතයිත්වා කම්මං කරෝති කායේන වාචාය මනසා" (1960: 208).

මේ අනුව ජෛන දර්ශනයේ දැක්වූ පරිදි පරම අවිහිංසාවාදය ප්‍රායෝගික නොවන නිසාවෙන් බුදුසමය තුළ එකහෙලා පිළිගැනීමක් දක්නට නොලැබේ.

කර්ම සංකල්පය නිගණ්ඨනාථපුත්ත විසින් ඉදිරිපත් කළ සුවිශේෂී සංකල්පයකි. ෂට් ශාස්තෲන් අතරින් කිරියවාදයක් ඉදිරිපත් කළ පළමු දාර්ශනිකයා මොහු වේ. මොහුගේ කර්මවාදය ඇතුළත් වන්නේ සබ්බං පුබ්බේකතහේතුවාදයටය. මෙමගින් අදහස් කෙරෙන්නේ සියලු සුවදුක් වින්දන පූර්ව කර්ම හේතුවෙන් සිදුවන බවයි. මෙම පිළිගැනීම ඇති තැන අර්ථවත් ආගමික ජීවිතයකට අවකාශය වැළකී යන බව බෞද්ධ ආකල්පයයි. මේ හරහා පුද්ගලයා සතු ස්වච්ඡන්දතාව නැතහොත් පුද්ගල කැමැත්ත මත පදනම්ව කටයුතු කිරීමට ඇති හැකියාව නිශේධනය වේ. ආත්මභාවය තුළ බල පැවැත්වෙන කිසිවක් පෙර කළ කර්මයට භාර දීම නොකළ යුත්තකි. පෙර කළ කර්මයට අනුව සියල්ල සිදු නොවේ. එය සිදුවන ආකාර පහක් පිළිබඳ බුදුදහමේ පෙන්වා දේ. එනම් පංච නියාමන ධර්මයන්ය.

- උතු නියාම
- බීජ නියාම
- කම්ම නියාම
- ධම්ම නියාම
- චිත්ත නියාම

තවද බුදුරජාණන් වහන්සේ දේශනා කර සිටියේ සියල්ල කර්මයට භාර දී බලා සිටීම පුද්ගලයාට නුසුදුසු බවත් එය උත්සාහයෙන් අලස බවින් තොරව වීර්යයෙන් යුතුව යහපත් ක්‍රියාවන්හි යෙදවීමෙන් වෙනස් කළ හැකි බවත්ය. උදාහරණයක් ලෙස දුප්පත්ව උපන් තැනැත්තෙකුට උත්සාහයෙන් යුතුව දහදිය මහන්සියෙන් කිසියම් රැකියාවක නිරත වීමෙන් පොහොසත් වීමට හැකියාව පැවතීමයි. මෙනිසා මෙම සංකල්පයද බුදු දහමේ යම්තාක් දුරට ප්‍රතික්ෂේප වේ. පූර්ව කර්මයම සාර වශයෙන් ගත්තවුන්ට මෙය කළ යුතුය මෙය නොකළ යුතුය කියා යමක් කිරීමේ රුචියක්ද උත්සාහයක්ද නැත. මෙසේ කළ යුත්ත නොකළ යුත්ත සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් නොදන්නා කල්හි සිහිමුලා වී අරමුණුවලින් අනාරක්ෂිතව ඉඳුරන් නැතිව වාසය කරයි. එවැන්නවුන්ට අර්ථවත් ශ්‍රමණ වාදයක් නැත. මහණෙනි මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටිය ඇති ඒ මහණ බමුණන් කෙරෙහි මාගේ ප්‍රථම කරුණු සහගත නිග්‍රහය වේ. යනුවෙන් මෙය තවදුරටත් කෙරෙන පැහැදිලි කිරීමක් අංගුත්තර නිකාය මහාවග්ගයේ දක්නට ලැබේ.

"පුබ්බෙකතං ඛෝ පන භික්ඛවේ, සාරතෝ පච්ඡාගච්ඡතං න හෝති ඡන්දෝ වා වායාමෝ වා ඉදං වා කරණීයං ඉදං වා අකරණීයත්ති. ඉති කරණීයාකරණීයෝ ඛෝ පන සච්ඡතෝ-ථේතතෝ අනුපලබ්ධියමානේ මුට්ඨස්සතීනං අනාරක්ඛානං විහරතනං න හෝති පච්චත්තං සහධම්මිකෝ සමණවාදෝ. අයං ඛෝ මේ භික්ඛවේ තේසු සමණ බ්‍රාහ්මණේසු ඒවංවාදීසු ඒවංදිට්ඨීසූ පඨමෝ සහධම්මිකෝ නිග්ගහෝ හෝති" (1960: 310)

මේ සඳහා සුදුසු තවත් නිදසුනක් මොළීයසීවක සූත්‍රයෙන් ප්‍රකට වේ. මොළීයසීවක නම් පරිබ්‍රාජකයා බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ 'ඇතැම් මහණ බමුණන් පවසන සියලු සුව දුක් නොදුක් නොසුව වින්දන පූර්ව කර්ම හේතුවෙන් යන කරුණ පිළිබඳ පවසන්නේ කුමක්දැයි' විචාරහ. එහිදී බුදුරජාණන් වහන්සේ පිළිතුරු ලබා දෙන්නේ, කර්මය එක් හේතුවක් පමණක් බවය. කර්මය පවතින එකම හේතුව බවට පත්කර ගැනීම තමා දන්නා දේ ඉක්මවා යන්නක් බවය. ලෝකයේ සත්‍ය සම්මතයක් ඉක්මවා යන බවය. එහෙයින් ඒ මහණ බමුණන්ගේ වචනය මුසාවක් බවට අංගුත්තර නිකාය නිබ්බේදික සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ පෙන්වා දේ.

"යං කිඤ්චායං පරිසපුග්ගලෝ පටිසංවේදියති සුඛං වා දුක්ඛං වා අදුක්ඛම සුඛං වා සබ්බං තං පුබ්බේකතහේතු'ති. යඤ්ච සාමං ඤාතං තඤ්ච අතිධාවන්ති. යඤ්ච ලෝකේ සච්චසම්මතං තඤ්ච අතිධාවන්ති, තස්මා තේසං සමණ බ්‍රහ්මණානං මිච්ජාති වදාමි" (1976: 208).

කර්ම සිදුකිරීමට මුල්වන කරුණු තුනක් ද ජෛන මහා වීරතුමන් විසින් පෙන්වා දුනි. එනම් ඉහතදී සඳහන් කළ ආකාරයට කායදණ්ඩ, වචී දණ්ඩ හා මනෝ දණ්ඩ යයි. නිගණ්ඨ ශ්‍රාවකයෙකු වූ උපාලි ගෘහපතියා ජෛන කර්මවාදය නියෝජනය කරමින් බුදුරජාණන් වහන්සේ සමග සිදු කළ වාදය මෙයට නිදසුනකි. එය මජ්ඣිම නිකාය උපාලි සූත්‍රයෙහි මෙලෙස දක්වයි.

ගෞතමයෙනි නිගණ්ඨනාථපුත්ත පව්කම් කිරීමට පව්කම් පැවැත්මට තුන් දණ්ඩනයක් දක්වයි. ඒ මෙසේ ය. කාය දණ්ඩ, වචීදණ්ඩ හා මනෝ දණ්ඩයයි.

"තීණි ඛෝ ආවුසෝ ගෝතම, නිගණ්ඨෝ නාතපුත්තෝ දණ්ඩානි පඤ්ඤාපේති පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තියා සෙයියථීදං: කාය දණ්ඩං වචී දණ්ඩං මනෝ දණ්ඩන්ති" (1973: 60).

මෙහිදී උපාලි ගෘහපතියා පවසා සිටින්නේ මේවායින් කාය දණ්ඩය ක්‍රියාවට මූලික වන බවයි. එසේ නැතහොත් කාය දණ්ඩය ප්‍රධාන බවයි. මෙය නිගණ්ඨනාථපුත්තගේ මතයයි. නමුත් බුදු සමයට අනුව ක්‍රියාවට මුල් වන්නේ චේතනාවයි. බුදු සමය කර්මවාදය පිළිගන්නකි. කරන ලද කර්මයට අදාල ප්‍රතිවිපාක ලැබෙන බවටද පිළිගනිති. නමුත් එය ඒකාන්ත නියතියක් ලෙස නොපිළිගනිති. බුදුසමය දක්වන ආකාරයට කය වචනය ක්‍රියාත්මක වන්නේ මනසේ බලපෑමෙනි. රූපාදිය පිළිබඳ ඇලීම් ගැටීම් රැවටීම් ඇතිවන්නේ ඵස්සය නිසාවෙනි. එනිසාම කර්මයේ වේමත්තතාවක් පවතින බව නිබ්බේධික සූත්‍රයේ දැක්වේ.

"කතමාච භික්ඛවේ කම්මානං වේමත්තතා, අත්ථි භික්ඛවේ කම්මං නිරයවේදනීයං, අත්ථි කම්මං තිරච්ඡානයෝනිවේදනීයං..., පෙත්තිවිසයවේදනීයං...., මනුස්සලෝකවේදනීයං..., දේවලෝකවේදනීයං.... කම්මානං වේමත්තතා..." (1976: 208).

ඒ අනුව නිරයට පමුණුවන, තිරිසන් යෝනියට පමුණුවන හා ප්‍රේත ලෝකයට පමුණුවන මනුෂ්‍යභවයට පමුණුවන, දිව්‍ය ලෝකයට පමුණුවන කර්මාදී වශයෙන් විවිධත්වයක් පවතී. එමෙන්ම කර්මය විපාක දෙන කාලය අනුව, කාර්ය අනුව, ආකාරය අනුව ආදී වශයෙන් කරුණු දොළහක් ද අභිධර්ම පිටකයෙහි පට්ඨානප්පකරන වැනි ග්‍රන්ථවල දක්නට ලැබේ. මෙම කර්මය නිරුද්ධ කරලීමට නම් ඵස්ස නැතහොත් ස්පර්ශය නිරුද්ධ කළ යුතුය. හේතුව නැති කිරීමෙන් ඵලය නැති වී යයි. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ඒ සඳහා ඇති ඒකායනම මාර්ගය වේ.

මේ අනුව මෙම ජෛන කර්ම සංකල්පය පිළිබඳ බෞද්ධ ආකල්පය නම් චේතනාව කර්මය වන බැවින් කයට අධික දුක් දීමෙන් (අත්තකිලමථානුයෝගය) කළ හැකි දෙයක් නොමැති බවයි.

ජෛන මහාවීරතුමන් බුදුරජාණන් වහන්සේ මෙන්ම ඊශ්වර නිර්මාණවාදය ප්‍රතික්ෂේප කරන්නෙකි. එනිසාම මොවුන් ශ්‍රමණ සම්ප්‍රදායට අයත් වේ. මෙලෙස අවධාරණය කරන ජෛන මහා වීරයන් කර්මක්ෂය කිරීමක් පිළිබඳව ඉදිරිපත් කරයි. මොහු ඉදිරිපත් කළ ආත්මවාදය කර්මවාදය හා සම්බන්ධයක් පවතී. එයට හේතුව වන්නේ මොහු ශරීරය නිසා ආත්මය පව් රැස් කරන බව එකහෙලාම පිළිගැනීමයි. මෙලෙස කර්ම රැස් නොවීමට නම් පුද්ගලයා අත්තකිලමථානුයෝගයෙන් නැතහොත් ශරීරයට අධික ලෙස දුක් දීමෙන් කර්මක්ෂය කළ හැකි බව අවධාරණය කරයි. පර්යේෂණය ඉහතදී දැක්වූ චතුයාම සංවරය හරහාද මොහුගේ අරමුණ වූයේ වර්තමාන කර්ම සිදුකිරීම වළකා සිටීමයි. එමගින් මොවුන් බලාපොරොත්තු වූයේ උතුම් වූ කේවලත්වයට පත්වීමයි. එය මොවුන්ගේ පරම සැපත වේ. එසේ නම් මොවුන්ට අනුව කේවලත්වයට පත්විය හැක්කේ අතීත කර්ම ක්ෂය කිරීමෙන් හා වත්මන් කර්ම රැස් නොවීමට වග බලා ගැනීම මතය.

ජෛන මහා වීර තුමන්ගේ සත්ථාවාදයට අනුව වෙනස්වන ලක්ෂණයන්ගෙන් යුක්ත ලෝකයෙහි අපරිවර්තනීය ස්වභාව සතක් පවතී.

- ජීව - ආත්මය
- අජීව - ආත්මයෙන් වෙන් වූ වස්තු
- ආශ්‍රව - ගලායාම
- බන්ධ - ආශ්‍රවයන්ගේ බැඳීමය
- සංවර - ඒ ආශ්‍රවයන්ගේ ගලා බැසීම නැවැත්වීම
- නිර්ජ - ජන්මාන්තර කර්මයන් ක්ෂය කිරීම
- මෝක්ෂ - කර්මක්ෂය කිරීමෙන් කේවලත්වයට පත්වීම

මේ අනුව ජෛන දර්ශනයේ ආචාර විද්‍යාත්මක පිළිවෙලද පැහැදිලි වේ. ජෛන මහා වීරයන් සප්තභංගි න්‍යාය අනුව ස්‍යාත්වාදය ප්‍රකාශ කරයි. එම න්‍යායයන් මෙසේය.

- ස්‍යාත් අස්ති - එසේ විය හැකිය.
- ස්‍යාත් නාස්ති - එසේ නොවිය හැකිය.
- ස්‍යාත් අස්ති - නාස්ති එසේ විය හැකිද නොහැකිද වේ.
- ස්‍යාත් අවක්තව්‍ය - එසේ වේ යැයි නොකිව හැකිය.
- ස්‍යාත් අස්ථි අවක්තව්‍ය - ඇත යන්නක් වේ යැයි නොකිව හැකිය.
- ස්‍යාත් නාස්ති අවක්තව්‍ය - නැත යන්නක් වේ යැයි නොකිව හැකිය.

- ස්‍යාත් අස්ථි නාස්ති අවක්තව්‍ය - ඇත්තෙත් වේ නැත්තෙත් වේ යැයි කිව නොහැකිය.

මෙම ස්‍යාද්වාදය ජෛන දාර්ශනිකයන්ට අයත් ප්‍රධානතම ඥාන සිද්ධාන්තයකි. මෙයින් ප්‍රකට කෙරෙන්නේ සෑම වස්තුවක්ම අනන්ත වූ ධර්මතාවයක් බවට පත් කරවන සිද්ධාන්තයකි. ශර්මා විසින් මෙය ඥානය පිළිබඳ සාපේක්ෂතාවක් ලෙස විස්තර කර ඇත. මෙම න්‍යායන් සතට අයත් ප්‍රධානතම ලක්ෂණයක් නම් ඥානය යන්න විය හැකි බවකින් සමන්විත වීමයි. ඒ අනුව කිසිදු කාරණාවක් ස්ථිරවම ප්‍රතිශේධනය හෝ නිශේධනය කළ නොහැකිය. ස්ථිරවම සත්‍ය යැයි පිළිගත හැක්කක් නොමැති වීමද පසක් කෙරේ. ඒ අනුව යම් කරුණක් පිළිබඳව සත් ආකාරයකින් විමසීමේදී පිළිතුරු නොදී සිටීම මෙම න්‍යායන් හත හරහා සිදු කෙරේ. ප්‍රශ්නයක් පිළිබඳ විමසීමේ දී මෙලෙස පිළිතුරු නොදී සිටීම බුදුසමය තුළ දක්නට නොවන්නකි. බුදුරජාණන් වහන්සේ විසින් සිය ශ්‍රාවකයන් කුමන හෝ ආකාරයේ ප්‍රශ්නයක් විමසීමේ දී පිළිතුරු ලබා දුන් ආකාර සතරක් අංගුත්තර නිකාය පඤ්හව්‍යාකරණ සූත්‍රයේ හඳුනාගත හැකිය.

"අත්ථි භික්ඛවේ පඤ්හෝ ඒකංසව්‍යාකරණියෝ.... විභජ්ජව්‍යාකරණියෝ..... පටිපුච්ඡාව්‍යාකරණියෝ.... ඨපනියෝ" (1982:90).

මෙයට අනුව ඒකංස ව්‍යාකරණය යනු ඒකාංගිකව නැතහොත් නිශ්චිතව පිළිතුරු ලබා දීමයි. විභජ්ජ ව්‍යාකරණීය යනු කරුණු බෙදා වෙන් කොට අදාළ පිළිතුරු ලබාදීමයි. ප්‍රති ප්‍රශ්න නගමින් පිළිතුරු ලබාදීම පටිපුච්ඡා ව්‍යාකරණීය වේ. ඨපනිය යන්නේ අදහස් කෙරෙන්නේ අසන්නාගේ ස්වභාවය අනුව සත්‍යාවබෝධයට අදාළ නොවීම හෝ සලකා බැහැර තබන ප්‍රශ්නය වේ. මේ අනුව ශ්‍රාවකයන්ගේ ගැටලුවලට අදාළ නිවැරදි පිළිතුරු බුදුරජාණන් වහන්සේගෙන් ලබා ගැනීමට ශ්‍රාවකයන්ට හැකිය. ඨපනීය යන්නෙන් වැරදි අර්ථයක් ගත යුතු නොවේ. එමගින් බැහැර කරනු ලැබෙන්නේ අසන්නාට නොගැලපෙන සත්‍යාවබෝධයට අදාළ නොවූ ප්‍රශ්න වේ. ඒවාට පිළිතුරු බුදුරජාණන් වහන්සේ සතු වුවද දේශනා නොකර බැහැර කරනු ලැබෙන්නේ එම දේශනා අවබෝධ කර ගැනීමට සුදුසු නුවණක් අසන්නාට නොමැති වීමත් යන අවබෝධය හා එයට පිළිතුරු දීමට ගියහොත් කුමන හෝ අන්තයකට ඒකාන්තයෙන්ම වැටෙන බවත් යන අවබෝධය මතය. එවැනි ප්‍රශ්න අව්‍යාකෘත ප්‍රශ්න ලෙසද හඳුන්වයි. දීඝ නිකාය පොට්ඨපාද සූත්‍රය, මජ්ඣිම නිකාය චූලමාලුඞ්ක්‍යපුත්ත සූත්‍රය, අග්ගිවච්ඡගොත්ත සූත්‍රය, සංයුක්ත නිකායේ අව්‍යාකත සංයුක්තය වැනි සූත්‍රවලද මෙම අව්‍යාකෘත ප්‍රශ්න හඳුනාගන්නට හැකිය. චූල මාලුඞ්ක්‍යපුත්ත සූත්‍රයේ දී ථේරවාදයට අනුව අව්‍යාකත ප්‍රශ්න දහයක් හඳුනාගත හැකිය.

"සස්සතෝ ලෝකෝ, අසස්වතෝ ලෝකෝ, අන්තවා ලෝකෝ, අනන්තවා ලෝකෝ, තං ජීවිතං තං ශරීරං, අඤ්ඤං ජීවං අඤ්ඤං ශරීරං, හෝති තථාගතෝ පරං මරණා, න හෝති තථාගතෝ පරං මරණා. හෝති ච න හෝති ච තථාගතෝ පරං මරණා, නේව හෝති න හෝති තථාගතෝ පරං මරණා" (1973: 154).

මෙවැනි වූ ප්‍රශ්නවලට බුදුරජාණන් වහන්සේ පිළිතුරු නොදී සිටියහ. අව්‍යාකත ප්‍රශ්නවලට පිළිතුරු ලබාදීමට ගියහොත් අන්තභජනය වීමක් සිදු වේ. මෙලෙස අන්තභජනය වීම ශ්‍රාවකයා අන්තගාමියකු බවට පත්කිරීමට හේතු වේ. මෙම ප්‍රශ්න පාරභෞතික ප්‍රශ්න වශයෙන්ද හඳුනාගත හැකිය. ඒ අනුව පිළිතුරු ලබාදීම ශ්‍රාවකයා අවුලෙන් අවුලට පත්වීමට හේතු වේ. ගැටුම් ඇතිවීමට පවා හේතු වේ. මේ අනුව ජෛන දර්ශනයට අයත් ස්‍යාත්වාදය ඥානයෙහි අවසානයට ගමන් ගන්නා අනුගාමිකයන්ට නුසුදුසු වූවකි. ඔවුන්ට ඇතිවන ගැටළු කිසිවකට ඒ හරහා සාධාරණ පිළිතුරක් නොලැබේ. බුදු සමය තුළදී ශ්‍රාවකයාට පත් ඕනෑම ගැටලුවක් ඉහත දැක්වූ කරුණු අනුව නිරාකරණය කර ගැනීමට අවස්ථාව හිමි වේ. එසේ නොවුනහොත් එය සත්‍යාවබෝධයට බාධාවකි.

ජෛන ඥාන වාදයෙහි පරෝක්ෂ සහ අපරෝක්ෂ වශයෙන් ප්‍රධාන කොටස් දෙකකි. එමෙන්ම මොවුන්ගේ ඥානය මති, ශෘති, අවධි, මනඃපර්යාය හා කේවල වශයෙන් පස් ආකාර වේ. මෙහි එන මති ශෘති  නම් ඥාන පරෝක්ෂ ඥානයට අයත් වේ. අනෙක් ඥාන ත්‍රිත්වය අපරෝක්ෂ ඥානයට අයත් වේ. මති යනු ඉන්ද්‍රිය අනුසාරයෙන් ලබාගන්නා දැනුමයි. එයට මනස ද බලපානු ලැබේ. මෙය අංග තුනකින් යුක්තය.

- ❖ උපලබ්ධි (සංජානනය)
- ❖ භාවනා (ස්මෘතිය)
- ❖ උපයෝග (අවබෝධය)

ශෘතිය යනු සංකේත, වචන මාර්ගයෙන් ලබාගන්නා දැනුම  වේ. එනම් මෙයට මූලික වන්නේ භාෂාවයි. මෙය කොටස් හතරකට බෙදා දැක්වේ.

- ❖ ලබ්ධිය (ආශ්‍රය)
- ❖ භාවනා (සිත එකලස් කිරීම)
- ❖ උපයෝග (අවබෝධය)
- ❖ නය (දේවල්හි විවිධ අර්ථ ස්වභාවය)

අවධි  යනු කාලය, අවකාශය ආදියෙන් ඔබ්බෙහි පවතින දැනුමයි. එය දිව්‍යමය ඥානයක් ලෙසද හඳුන්වයි. සාමාන්‍ය පුද්ගලයෙකුට ඇසට පෙනෙන වටපිටාවේ නැතහොත් පුද්ගලයා සිටි කාලය තුළ වටපිටාවේ දක්නට ලැබූ තත්ත්වය පිළිබඳ ඍජුවම පිළිතුරක් ලබාදීමට හැකිය.

නමුත් ඇසට නොපෙනෙන වටපිටාවක ඇති දේ සහ තමන් නොසිටි වේලාවක එම ස්ථානයේ සිදුවූ දේ පිළිබඳ සෘජුවම පිළිතුරු ලබාදිය නොහැකිය. අවධි නම් මෙම සාමාන්‍ය පුද්ගලයාට කිව නොහැකි තත්ත්වයකි. ඒ නිසාමය දිව්‍යමය ඥානයක් ලෙසට හඳුන්වයි. මනඃපර්යාය යනු අනෙකාගේ සිත්වල විවිධ ස්වරූප දැකීමේ හැකියාවයි. කේවල නැතහොත් කෛවල්‍ය ඥානය යනු සියලුම දේවල් පිළිබඳ සියලුම ආකාරයෙන් දැනීමේ හැකියාවයි. ආවරණයන් විනාශ වීම නිසා චෛතසිකයන් ජීවයේ ස්වරූපයෙන් ප්‍රකට වීම කේවල ඤාණය ලෙස හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමියන් විසින් පරිවර්තනය කරන ලද භාරතීය දර්ශන නම් ග්‍රන්ථයේ දැක්වේ. මෙය ජෛන දර්ශනයේ උසස්ම ඥානය වේ. එනිසා මෙය සර්වඥතා ඥානයකි. ඔවුන් මෙය සලකනුයේ විස්තර කළ නොහැකි අවබෝධ කරගත හැකි ඥානයක් ලෙසටය. ඔවුන් පෙන්වා දෙන්නේ බැඳීම්වලින් තොර පාරිශුද්ධ වූ ආත්මයක පැවැත්ම ඒ සඳහා අවශ්‍ය බවයි. ජෛන මූලාශ්‍රයන්ට අනුව මති, ශෘති සහ අවධි වැරදි සිදුවීමට හැකි ඒවා බවත්, මනඃපර්යාය කේවල ඥානය වැරදි වීමට නොහැකි ඒවා බවත් දක්වා ඇත. සිද්ධසේන දිවාකර විසින් සංජානනය හෙවත් ප්‍රත්‍යක්ෂය ආකාර හතරකට බෙදා දක්වයි.

- දෘෂ්‍ය සංවේදනවලින් ලැබෙන ප්‍රත්‍යක්ෂය
- අදෘශ්‍ය ඉන්ද්‍රියයන්ගෙන් ලැබෙන ප්‍රත්‍යක්ෂය
- අවධි හෙවත් දිවැසින් ලබන ප්‍රත්‍යක්ෂය
- කේවල හෙවත් සර්වඥතා ඥානයෙන් ලබන සීමා රහිත වූ සියලු සත්තාව අවබෝධ කරවන්නා වූ පූර්ණ ප්‍රත්‍යක්ෂය

මනසෙහි පවත්නා වටිනාකම අවබෝධ කරගත් ජෛනයන් දර්ශනය හා ඥානය මනස ප්‍රකට කරවන බව දක්වයි. ඒ අනුව දර්ශනය සිදු කිරීමේදී සම්පූර්ණ විස්තර සහිතව ප්‍රත්‍යක්ෂ කිරීම දුෂ්කර බව ඔවුන් දක්වයි. නමුත් ඥානය ලබා ගැනීමේදී සියලු කරුණු ප්‍රත්‍යක්ෂ කෙරෙන බව දක්වයි. ජෛනයන්ට අනුව ඉන්ද්‍රිය අවයව සහ මනස පුද්ගලයාගේ දැනීම ඇති කරන්නට උපකාර වන්නකි. එමගින් ප්‍රත්‍යක්ෂ ගොඩනැගේ. බාහිර දෑ සමඟ ඉන්ද්‍රිය හා මනස ගැටීමෙන් ප්‍රත්‍යක්ෂය ඇතිවේ.

ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය බෞද්ධ දර්ශනයෙහි ද දක්නට ලැබෙන්නකි. එනම් ඉන්ද්‍රිය අනුසාරයෙන් ලබාගත් දැනුම වේ. පොත්පත්හි මෙය හඳුන්වන්නේ ස්වයංභූඤාණය ලෙසටය. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂයෙන් ලබන දැනීම පිළිබඳ මජ්ඣිම නිකාය මධුපිණ්ඩික සූත්‍රයේදී හඳුනා ගත හැකිය."චක්ඛුඤ්චාවුසෝ පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සඞ්කති ඵස්සෝ. ඵස්ස පච්චයා වේදනා. යං වේදේති, තං සඤ්ජානාති..." (ඇස රූපය හා ගැටීමෙන් චක්ඛු විඤ්ඤාණය උපදී...) (1973: 280).

මෙලෙස චක්ඛු විඤ්ඤාණය නිසාවෙන් ස්පර්ශය ඇති වේ. එය සුඛ දුක්ඛ අදුක්ඛමසුඛ ආදී වශයෙන් වේදනා ඇති කරයි. අනතුරුව හැඳිනීම හෙවත් සංජානනය ඇතිවේ.

මජ්ඣිම නිකාය චුල්ලහත්ථිපදෝපම සූත්‍රයේද ඉන්ද්‍රීය ප්‍රත්‍යක්ෂයට මනා උපමාවක් දක්නට ලැබේ. එහිදී අන්ධයන් කිහිපදෙනෙකු ඇතකුගේ ස්වරූපය කියන ආකාරය අනුව ඇතාගේ ස්වරූපය අවබෝධ කර නොගත යුතු බව මේ මගින් ප්‍රකට කෙරේ. එනම් තමා තවදුරටත් ඒ පිළිබඳ අධ්‍යයනය කළ යුතුය. බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ නිවැරදි වීමට නම් ඇසින් මනාව පෙනිය යුතු බවත්, බාහිර අරමුණු ඉන්ද්‍රියට ගැටිය යුතු බවත්, අරමුණෙහි පිහිටි සිහිය තිබීමත් වැදගත් බවයි. සෑම විටම ඉන්ද්‍රියට ප්‍රත්‍යක්ෂ වන දෑ නිවැරදි නොවේ. එය ඇතැම් අවස්ථාවල මිථ්‍යාදෘෂ්ටියකට යොමු කරවයි. මේ කාරණය ප්‍රකට කෙරෙන කාරණා දහයක් කාලාම සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ පෙන්වා දේ. එහිදී කාලාම වැසියන්ට බුදුරජාණන් වහන්සේ දේශනා කර සිටියේ, "තමන් යමක් ඇසූ පමණින්, පරම්පරාවෙන් ආ පමණින්, මෙසේ යයි කී පමණින්, ආගමික පොතපතට ගැලපුන පමණින්, තර්කයට එකඟ වූ පමණින්, න්‍යායානුකූල වූ පමණින්, ආකාර වූ පමණින්, තම දෘෂ්ටියට එකඟ වූ පමණින්, සුදුසු සේ පෙනෙන බැවින්, ගුරුවරයා කී පමණින් නොපිළිගත යුතු බවයි." තවද මජ්ඣිම නිකාය සන්දක සූත්‍රයේ දී අසන ලද දෙය නිදහස් චින්තනයට බාධාවක් වන අයුරු කරුණු සතරකින් පෙන්වා දේ.

- සුස්සුතම්පි හෝති - අසන දේ හරිවන්නටත් පිළිවන
- දුස්සුතම්පි හෝති - අසන දේ වැරදි වන්නටත් පිළිවන
- තථාපි හෝති - එසේ වන්නට පිළිවන
- අඤ්ඤථාපි හෝති - අන් අයුරක් වන්නට පිළිවන
- තර්කයෙහි දෝෂ සහිත කරුණු හතරක් ද සන්ධක සූත්‍රයෙහි ඇතුළත් වේ.
- සුත්තබිතම්පි හෝති - හරි තර්කයක් වීමටද පිළිවන
- දුත්තකිත්ම්පි හෝති - වැරදි තර්කයක් වීමටද පිළිවන
- තථාපි හෝති - එසේ වන්නට පිළිවන
- අඤ්ඤථාපි හෝති - අන් අයුරක් වීමටද පිළිවන

මෙම සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ කාලාමයන්ට පවසා සිටින්නේ "යම් කලෙක මේ ධර්මය කුසල්ය. මේ ධර්මය නිවැරදිය. මේ ධර්ම නුවණැත්තන් විසින් ප්‍රකාශ කරන ලදී. සම්පූර්ණ කරන ලදී. සමාදන් වෙන ලදී. එනිසා මෙම ධර්මය හිතසුව පිණිස වැඩ පිණිස වේ යැයි සිතා නුඹලා දැනගත් විට ඊට එළැඹ වාසය කරන" ලෙසයි.

"යදා තුම්හේ කාලාමා අත්තනාව ජානෙය්‍යාත, ඉමේ ධම්මා කුසලා ඉමේ ධම්මා අනවජ්ජා ඉමේ ධම්මා විඤ්ඤූප්පසත්තා, ඉමේ ධම්මා සමත්තා සමාදින්නා හිතාය සුඛාය සංවත්තන්තීති. අථ තුම්හේ කාලාමා උපසම්පජ්ජ විහාරෙය්‍යාථ" (1960: 336).

මෙලෙස ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය පවා නිවැරදිව සිදුකරගත යුතු ආකාරය පිළිබඳ මනා ඉගැන්වීම් සංග්‍රහයක් බෞද්ධ දර්ශනයට ඇතුළත් වේ.

බෞද්ධ දර්ශනයට අනුව යථාර්ථය අවබෝධ කරගැනීම සඳහා ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය වැදගත් වේ. ජෛනයන්ට අනුව ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය මුල් මට්ටමක පවතින්නකි. ඔවුන් එයට වඩා උසස් ඥානය පිළිබඳ වැඩි අවධානයක් යොමු කරයි. බුදුදහමට අනුව මෙය ආරම්භයක් වුවත් එය උපාදානයට හේතුවේ. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය හරහා ඇත්ත ඇති සැටියෙන් දැකීම තුළ ප්‍රඥාවෙන් යුක්ත වන්නා හට නිවන් මාර්ගයට පිවිසීමට හැකිය. මේ අනුව මෙහි බෞද්ධාකල්පය නම් ජෛන දර්ශනයේ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය ප්‍රායෝගික හා දාර්ශනික වශයෙන් ප්‍රමාණවත් නොවන බවයි.

අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය බෞද්ධ දර්ශනයේ ද අඩංගු වන්නකි. ජෛන දර්ශනය තුළ මේ යටතට ගැනෙන්නේ අවධි, මනඃපර්යාය හා කේවල ඥානයි. අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය තුළ සිදු කෙරෙන්නේ මනස දියුණු කිරීමයි. මෙලෙස මනස දියුණු කර ගැනීමෙන් රූපාවචර කුසල සිත් වන ප්‍රථම ධ්‍යාන, ද්‍රිතිය ධ්‍යාන, තෘතිය ධ්‍යාන, චතුර්ථ ධ්‍යාන හා පංච ධ්‍යානය යනාදී සිත් ඇති කර ගැනීමට හැකිවේ. එමෙන්ම ආකාසඤ්ඤායතන,විඤ්ඤාණඤ්ඤායතන,ආකිඤ්ඤායතන,නේවසඤ්ඤානාසඤ ඤාතන ආදී තත්ත්වයන්ට පවා ප්‍රවිෂ්ඨ වීමට මෙමගින් හැකියාව ලැබේ. මෙවැනි පිරිස් බුදුරජාණන් වහන්සේට පෙර සහ සමකාලීනව ද සිට ඇත. උදාහරණ ලෙස වෛදික උපනිෂද් ගුරුවරුන් වූ ආලාරකාලාම උද්දකරාමපුත්ත වැන්නවුන් පෙන්වා දිය හැකිය. නමුත් මෙම තත්ත්වය බුදුරජාණන් වහන්සේ ප්‍රාමාණිකත්වයෙන් නොසැලකූහ. එම තත්ත්වයෙන් වඩාත් උසස් වූ තත්ත්වයක් පවතී. එය බුදුරජාණන් වහන්සේ විසින් සොයා ගත්හ. එය නම් නිවනයි. ජෛන දර්ශනයේ දී ඔවුන් සිය අවධි මනඃපර්යාය හා කේවල යන ඤාණයන් හරහා ලබාගන්නා අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයේ යථාර්ථවත් සත්‍යමය දෘෂ්ටියක් ලබා දෙන බව විශ්වාස කළහ. බෞද්ධ දර්ශනය තුළ මෙය පිළිගනු ලැබුවේ කිසිදු ආත්මවාදයකට හෝ සර්වඥතාවයකට අනුරූපව නොවේ. මෙම තත්ත්වයන් ස්ව භාවනා මාර්ගයෙන් ලබාගත හැකි වූවකි. එලෙස ලබා ගත හැකි අභිඤ්ඤා පහක් පිළිබඳ බුදුදහමේ දැක්වේ. ඒවා පඤ්චාභිඤ්ඤා යනුවෙන් හැඳින්වේ.

- ඉද්ධිවිද ඥානය - සෘද්ධි ප්‍රාතිහාර්ය පෑමේ හැකියාව
- දිබ්බසෝත ඥානය - දිව්‍යමය ඇස් ඇති බව
- පරිචිත්තවිජානන ඥානය - අන් අයගේ සිත් දැකීමේ හැකියාව
- පුබ්බේනිවාසානුස්සති ඥානය - පෙර ආත්මභාවයන් දැකීමේ ඥානය
- දිබ්බචක්ඛු - දිව්‍යමය ශබ්ද ඇසීමේ ඇති හැකියාව

ජෛන දර්ශනයේ ඉගැන්වීමට අනුව මෙම තත්ත්වය සත්‍යමය වේ. නමුත් බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ මේවා භාවනාවේ ප්‍රතිඵල බවත් ඒවාට නොඇලී අනිත්‍ය බව සහ අනාත්ම බව දකිමින් නිවන් සාක්ෂාත් කිරීම වටින බවත්ය.

ඒ අනුව බුදුරජාණන් වහන්සේ ආසවක්ඛ ඤාණය වූ අවසන් ඥානය වඩා සියලු කර්ම ක්ෂය කිරීමෙන් උතුම් වූ නිර්වාණයට එළඹියහ. ඒ අනුව ජෛන දර්ශනයේ අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය යම්තාක් දුරට ප්‍රතික්ෂේප කෙරේ.

## 7. නිගමනය

දර්ශනය මිනිසාගේ ජීවිතය, ලෝකය හා සත්‍යය පිළිබඳ ගැඹුරු ලෙස විමර්ශනය කරන බුද්ධිමය විෂය ක්ෂේත්‍රයකි. එනිසාම ලෝකයෙහි දක්නට ලැබෙන පුළුල් විෂයක් ලෙස දර්ශනය යන විෂය හඳුනාගත හැකිය. එහි ඇතුළත් එක් සුවිශේෂී උප විෂයක් වන්නේ ඥාන විභාගයයි. ඒ තුළ ඥානය පිළිබඳව දැනුම ලැබෙන ආකාරය අධ්‍යයනය කෙරේ. ඒ සඳහා විවිධ දර්ශනවාද විවිධ ඥාන මාර්ග අනුගමනය කළ ආකාරයක් හඳුනාත හැකි අතර එම දර්ශන වාද අතර ජෛන දර්ශනය ඉතාමත් සුවිශේෂී වේ. එයට මූලිකම හේතුව වන්නේ ඔවුන්ගේ ඥාන මාර්ගය පුද්ගලයා හා සමාජයට වැදගත් නිසාවෙන් ජනයා අතර ඉතාමත් ප්‍රචලිත වීමයි. නමුත් ඔවුන්ගේ ඥාන මාර්ගය සර්වඥතාව පිළිගැනීම, ආත්මවාදය වැනි දෑ මත පදනම් විය. එනිසාම මොවුන්ගේ ඥාන දර්ශනය බෞද්ධ ඥාන දර්ශනය සමග සංසන්දනයට ලක් කළ හැකිය. ඒ අනුව පෙනී යන්නේ ජෛන ඥාන විභාගයට අදාළ ඥාන මාර්ගයන් බුදුසමය යම්තාක් දුරට පිළිගන්නා නමුදු වැඩි වශයෙන් ඔවුන්ගේ ප්‍රතිවාර ප්‍රතික්ෂේප කර ඇති බවයි.

## 8. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

**ප්‍රාථමික මූලාශ්‍රය**

අංගුත්තරනිකාය. ප්‍රථම භාගය, (1960). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර්මුද්‍රණ, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
අංගුත්තරනිකාය. දෙවන භාගය, (1982). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර්මුද්‍රණ, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
අංගුත්තරනිකාය. සිව්වන භාගය, (1976).බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර්මුද්‍රණදෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
දීඝනිකාය. ප්‍රථම භාගය, ((1957).) බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර්මුද්‍රණ  දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
මජ්ඣිමනිකාය. දෙවන භාගය, ((1973). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර්මුද්‍රණ  දෙහිවලඃ බෟද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
සංයුක්තනිකාය. සිව්වන භාගය, (1981).) බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර්මුද්‍රණ, දෙහිවලඃබෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**ද්විතියීක මූලාශ්‍රය**

එදිරිසිංහ, දයා. (2017). අවෛදික දර්ශන හා ජෛන ඥාන විභාගය. දෙහිවලඃ වත්මා ප්‍රකාශකයෝ.
ධම්මරතන, නාරාවිල, (2015). භාරතීය දර්ශන. දෙහිවල. බෞද්ධ සංස්කෘතික මණ්ඩලය.
පඤ්ඤාකිත්ති, හිරිපිටියේ. (1999). භාරතීය දර්ශන. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
ඤාණිස්සර, ඇල්පිටියේ. (1988). භාරතීය දර්ශන. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
රාධාක්‍රිෂ්ණන්. (2013). ඉන්දීය දර්ශනය 1. අතුරුගිරියඃ රත්න පබ්ලිෂස් ඇන්ඩ් ප්‍රින්ටර්ස් පුද්ගලික සමාගම.
ජයතිලක, කේ. එන්. (2003). මුල් බුදු සමයේ ඥාන විභාගය. කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.